# අපේ බිත්තර වී අපිම හදමු

වී ඇටයක් ගොඩ නැගෙනුයේ එම මලෙහි ඇති ඩිම්බයක් එම මලෙහි ඇති පරාගයක් සමග එකට මුහුම් වීමෙනි. එබැවින් වී ශාකය ස්වපරාගනය වන්නක් වශයෙන් හඳුන්වනු ලැබේ. මෙම ස්වභාවය නිසාම ඔබට අවශ්‍ය බිත්තර වී ඔබටම සකස් කර ගැනීමේ හැකියාව ඇත.

ඉහළ ගුණාත්මක බිත්තර වී භාවිතය අස්වැන්න ගුණාත්මකව හා ප්‍රමාණාත්මකය වැඩිවීමට හේතු වේ.

- වල් ඇට වලින් තොර
- වෙනත් වී වර්ගයක් සමග කලවම් නොවූ
- යාන්ත්‍රිකව හානි නොවූ ඇට සහිත
- කෘමීන් හෝ රෝග ආදියෙන් තොර
- ඉහල පැළවීමේ ප්‍රතිශතයක් ඇති (අවමය 85%)
- හොඳ පෙනුමක් සහිත වී ඉහළ ගුණාත්මක බිත්තර වී ලෙස හැඳින්විය හැක.

සුළු වී ප්‍රමාණයකින් වුවද බිත්තර වී සකස් කර ගැනීම් ආරම්භ කළ හැකිය. ගුණාත්මක බීජ ග්‍රෑම් 100 ක් 200 ක් වුවද මේ සඳහා ප්‍රමාණවත් වේ. මෙසේ මුලිකව ගනු ලබන බිත්තර වී විශ්වාසවන්ත වූ බීජ මූලාශ්‍රයකින් ආරම්භ කිරීම වැදගත්ය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බිත්තර වී නිෂ්පාදන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලියාපදිංචි බිත්තර වී හෝ සහතික කළ බිත්තර වී නම් වඩාත් සුදුසුය.

**බෝගය රෝපණය කර ගැනීම**

1. කුඹුරට ගැලපෙන වී වර්ගය තෝරා ගැනීම
2. එම වී වර්ගය කුඹුරේ හොඳම කොටසේ වගා කිරීම
3. වී ඇට පෙළට දැමීම හෝ පැළ සිටුවීම මේ සඳහා වඩාත් සුදුසුය.
4. නිසි කලට වැපිරීම හෝ පැළ සිටුවීම ඉතා වැදගත්ය.

අහස් දියෙන් වගා කරන ගොවි මහතෙකු නම් යල කන්නයට වගා කරන කාලය සැලසුම් කරගත යුත්තේ අගෝස්තු මාසයේ ආරම්භ වන වියළි කාලයට අස්වනු කපා පාගා වේලා ගබඩා කර තබාගත හැකිවන පරිදිය.

මහ කන්නයට වගා කරන කාලය සකසා ගත යුත්තේ පෙබරවාරි මාසයෙන් ආරම්භ වන වියළි කාලයට අස්වනු කපා පාගා වේලා ගබඩා කර තබාගත හැකි වන පරිදිය.

වගා කාල සටහන (අහස් දියෙන්)

| වයස් කාණ්ඩය | යල කන්නය | මහ කන්නය |
|---|---|---|
| මාස 4 1/2 | අප්‍රේ. 01 - අප්‍රේ. 15 | සැප්. 15 - සැප්. 30 |
| මාස 4 | අප්‍රේ. 10 - අප්‍රේ. 30 | ඔක්. 01 - ඔක්. 15 |
| මාස 3 1/2 | මැයි 01 - මැයි 15 | ඔක්. 15 - ඔක්. 30 |
| මාස 3 | මැයි 16 - මැයි 30 | නො. 01 - නො. 15 |
| මාස 2 1/2 | මැයි 31 - ජුනි 15 | නො. 15 - නො. 30 |

**ආචාර්ය අමිතා පී බෙන්තොට**
**අතිරේක අධ්‍යක්‍ෂ, මාෂ හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, අඟුණකොළපැලැස්ස**

වගා කාල සටහන (ජල සම්පාදනයෙන්)

ජල සම්පාදනය යටතේ වගා කරන ගොවි මහතෙකු වගා දිනය තීරණය කළ යුත්තේ ජලය ලබාදීමේ කාල සටහන ද සැලකිල්ලට ගැනීමෙනි.

**බිම් සැකසීම හා වගා නඩත්තුව**

පළමු හිය දෙවන හිය සහ බිම් මට්ටම් කිරීම හොඳින් සිදු කිරීම ඉතාම වැදගත්ය. සී සෑම් දෙකක්

අතර අවම වශයෙන් සති 02 ක වත් පරතරයක් තිබීම වල් මර්ධනයට මෙන්ම බෝගයේ මනා වර්ධනයටත් හේතු වේ.

බිම් නිසි පරිදි මට්ටම් කිරීමෙන් කුඹුරට යොදන පොහොර වල් නාශක ආදිය ක්‍රමානුකූලව කුඹුරේ සෑම තැනකටම පැතිරියාම නිසා ගොයමේ ඒකාකාරී වර්ධනයක් දැකිය හැකිය.

## කුඹුරට පොහොර යෙදීම

### කාබනික පොහොර

හැකි සෑම විටම කාබනික පොහොර යෙදීම පසේ ව්‍යුහය වයනය වැඩි දියුණු කරන අතර එමගින් ශාකයට අවශ්‍ය අංශුමාත්‍ර මූලද්‍රව්‍ය හා අනෙකුත් පෝෂක කොටස් ද ලැබේ. මේ සඳහා පිදුරු යෙදීම ග්ලිරිසීඩියා වැනි කොළ අතු යෙදීම වඩාත් සුදුසු වන අතර පිදුරු යෙදීමේදී එම වගියේම පිදුරු යෙදීම තුළින් කළවම් පැළ මතුවීම වලකාලයි. වෙනත් පිදුරු භාවිතා කරන්නේ නම් පළමු හියට පසුව යෙදීමෙන් දිරා යාමට සැලසිය හැකිය. තවද එම පිදුරු කොම්පෝස්ට් කර යෙදීමට ද හැකිය. නැතහොත් බිත්තර වී සාද ගන්නා කොටසට පිදුරු හැර අනෙකුත් කාබනික පොහොර යෙදීම කළ යුතුය.

වයස් කාණ්ඩය හා කෘෂි දේශගුණික කලාපය අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිර්දේශිත පොහොර සැලකිල්ලට ගෙන කුඹුරට උචිත ලෙස පොහොර යෙදීම කළ යුතුය.

- හැකි සෑම විටම අමිශ්‍ර පොහොර යොදන්න

### කළවම් ඉවත් කිරීම

කුඹුරට අනිසි ලෙස වී ඇට පැමිණීම බහුලව සිදුවන්නේ

1. කළවම් ඇට සහිත බිත්තර වී භාවිතා කිරීම
2. කලින් කන්නයේ වී ඇට කුඹුරේ වැටී පැළ වීම (ප්‍රමාද වී අස්වනු නෙලීම නිසා)
3. ජල ගැලීම් වැනි ක්‍රම වලිනි

මෙලෙස පැමිණි කලවම් වී ඉවත් කිරීමට විවිධ ලක්ෂණ උපයෝගී කරගත හැක

1. පිදීමේ වෙනස්කම් : වගා ප්‍රභේදයට වඩා පමා වී හෝ කලින් පිදෙන ගස් ඉවත් කළ යුතුය
2. පැළයේ උස : වගාකර ඇති ප්‍රභේදයට වඩා උස හෝ මිටි වෙනත් වගී ගස් ඇත්නම් ඒවා ඉවත් කළ යුතුය
3. කඳේ හෝ පත්‍රවල ලක්ෂණ : කඳේ හෝ පත්‍ර වල වර්ණය හැඩය වෙනස් වී ඇති ගස් ඉවත් කළ යුතුය
4. කරලේ ඇට වල ස්වභාවය : ඇට වල හැඩය සහ පැහැය වෙනස් වී ඇති ගස් උදුරා දැමීම කළ යුතුය
5. එසේම නන්ඩු සහිත ඇට ඇති ගස් ඉවත් කළ යුතුය
6. සහල් වල පැහැය : ධාන්‍යයේ පැහැය (රතු හෝ සුදු) වෙනස් වී ඇති ගස් ඉවත් කළ යුතුය. උදේ කාලයේ පින්න සහිත වන විට පතිත වන හිරු එළියෙන් මෙය පැහැදිලිව හඳුනාගත හැක.

### වල් පාලනය

තවද වල් ඇට බිත්තර වී වලට එකතු වීම තුළින් බිත්තර වී වල ගුණාත්මය අඩුවීමක් වේ. එසේම කුඹුරට නව වල් ඇට වගී හඳුන්වාදීම ද මේ තුළින් සිදුවිය හැක.

### වල් පාලනය සඳහා

1. මනා ලෙස බිම් සැකසීම
2. ජල පාලනය
3. අතින් හෝ වල් මර්ධන යන්ත්‍ර භාවිතයෙන් යාන්ත්‍රික වල් මර්ධනය
4. රසායනික වල් මර්ධනය (වල් නාශක නියමිත සාන්ද්‍රණයකින් නියමිත වේලාවකට භාවිතා කළ යුතුය.)

යම් හෙයකින් කුඹුරේ වල් පැළ තිබුණහොත් ඒවා ඉවත් කර අස්වනු සමග මිශ්‍ර නොවන ලෙසට වග බලා

ගත යුතුය. අස්වනු නෙලන විට වල් ඇට තවත් මිශ්‍ර වී ඇති නම් සල්අඩ භාවිතය මගින් කුඩා වල් ඇට ඉවත් කරගත හැකිය.

**නිසි කලට ගොයම් කෙළීම**

කරලේ වී ඇට 85% ක් පමණ රන්වන් පාට වූ විට අස්වනු නෙලාගත යුතුය. මේ වනවිට ඉතුරුව ඇති කොළපාට ඇට බොහෝ විට ඔබට ආර්ථික අස්වැන්නක් ගෙන නොදේ. එබැවින් ඒ ගැන නොතකා නිසි ලෙස මෝරා ඇති සරු ඇට සහිත කරල් කපා පාගා ගත යුතුය. නිසි කලට අස්වනු නෙලා නොගතහොත් වැසි තත්ත්වයන් යටතේ එම ඇට කරලේ පැළවීම නිසා හානි වී යා හැකිය. තවද කරලේ ඇට වැලිමෙන් ඇට වල බර අඩු වන අතර එම ඇට වලින් නිසි දිරිමත් බීජ පැළ නොලැබේ. අස්වනු නෙලන දිනය තීරණය කර ගැනීම සඳහා ගොයම 50% ක් මල් පිපී ඇති විට එම දිනයේ සිට දින 26-30 ත් අතර කාලයක් ගණන් බලා අස්වනු නෙලීමට සූදානම් වීම වඩාත් ප්‍රායෝගික වේ.

**යාන්ත්‍රික හානි අඩුකර ගැනීම**

වී ඇට යාන්ත්‍රික හානි වූ විට ඒවායේ පැළවීමේ දුර්වලතාවයන් වන අතර නිරෝගී ශක්තිමත් පැළ නොලැබීම ද සිදු වන බැවින් ඉන් ආරම්භ කරනු ලබන වගාවෙන් වැඩි අස්වැන්නක් නොලැබී යා හැකිය. බහුලව යාන්ත්‍රික හානි දක්නට ලැබෙනුයේ රෝද 4 ට්‍රැක්ටරය භාවිතා කොට වී පැගීමෙනි. එබැවින් හොඳින් පිරිසිදු කරගත් කොළ මඩින යන්ත්‍ර හෝ හුළං අඩු කොට රෝද හතරේ ට්‍රැක්ටරය භාවිතා කිරීම හෝ සතුන්/මිනිසුන් මගින් පැගීම සිදු කිරීමෙන් යාන්ත්‍රික හානි අවම කරගත හැකිය.

- කමත හොඳින් පිරිසිදු කර බිත්තරට ගන්නා වී වර්ගය පමණක් එකවරක කමතේ පැගීම තුළින් පිරිසිදු බිත්තර වී සකසා ගත හැකිය. කොළ මඩින යන්ත්‍ර භාවිතා කරන්නේ නම් වෙනත් වී ඇට නොමැති වන ලෙස භාවිතයට පෙර එය පිරිසිදු කර ගත යුතුය.

**කෘමි හානි අඩුකර ගැනීම**

ක්ෂේත්‍රයේ ගොයම් ඇති විටත් ගොයම් කපා ගබඩා කර ඇති විටත් කෘමි හානි ඇති විය හැකිය. කුඹුරේදී ගොයම් මැස්සාගේ හානිය සිදු වූ විට වී ඇට වල කළු ලප ඇතිවී වී ඇට වල පෙනුම ඉතාමත් දුර්වල කරයි. බොහෝ විට ඉන් බොල් ඇට හෝ අසම්පූර්ණ ඇට ඇති වේ. ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රම මගින් කුඹුරට වන කෘමි හානි අඩුකර ගත හැකි අතර ගොයම් මැස්සාගෙ ගහණය වැඩිවන්නේ නම් පමණක් රසායනික බෙහෙත් යෙදීම කළයුතු වේ. ගබඩා කර ඇති වී වලට බොහෝ දුරට කෘමි හානි වැඩි වනුයේ නිසි පරිදි වියලා නොමැති බීජ ගබඩා කිරීම නිසාය. එසේම ගබඩා කරන මළු ආදියෙන් හා ගබඩා ස්ථානයෙන් මෙවන් කෘමීන් ඔබේ බිත්තර වී වලට පැමිණිය හැකිය. මේ සඳහා නිසි පරිදි බීජ වියලා පිරිසිදු කර මළු වල බහා පිරිසිදු ස්ථානයක ගබඩා කර තැබීම මගින් එම බීජ බිත්තරට ගැනීම තෙක් කෘමීන්ගේ හානි වලින් තොරව ගබඩා කර තබාගත හැකිය. ගබඩා හානි වේනම් නික, මදුරුතලා, යුකැලිප්ටස්, අමුකහ, පැඟිරි කොළ හෝ කොහොඹ කොළ දින 3-5 ක් පමණ පවනේ වේලා කුඩා කුඩා කොටස් වලට කපා වී සමග කලවම් කිරීම මගින් කෘමි හානිය අවම කර ගත හැකිය.

**ප්‍රරෝහණය**

අස්වනු නෙලූ විගසම බීජ වල ප්‍රරෝහනය දුර්වලය. මෙයට හේතුව බීජ වල ස්වභාවිකවම සති 3-4 ක් පමණ පවතින සුප්තකාලයයි. ඉන්පසු ඉබේටම සුප්තතාවය බිඳී ගොස් පැළවීම සිදුවේ. මෙම පැළ වීම බොහෝ විට තෙත් කලාපයේදී මාස 4-6 ක් පමණ තිබී ක්‍රමානුකූලව අඩු වී යයි. එහෙත් නෙලාගත් බීජ වල තෙතමනය 13% ක් හෝ ඊට අඩු මට්ටමක තබා ගැනීම තුළින් බීජ වල ජීව්‍යතාවය වැඩි කාලයක් රඳවාගත හැකිය. බිත්තර වී වල ප්‍රරෝහණය ප්‍රතිශතය අවම වශයෙන් 85% ක් විය යුතුය. වී ඇට 100 ක් දිනක් ජලයේ පොඟවා ගෙන තෙතමනය සහිත පොල් කටුවක පිරිසියක හෝ සුළඟ භාජනයක දමා

දින 3-5 කින් බැලූ විට 85% ක් පමණ බීජ ප්‍රරෝහණය වන්නේ නම් ඒවා බිත්තර වී සඳහා සුදුසු වේ. පැළ වන තෙක් තෙතමනය පවත්වාගත යුතුය.

**පෙනුම**

බීජ පොත්තේ ලප දිලීර බැඳී අවපාට වී ඇත්නම් එම බිත්තර වී වල ගුණාත්මය අඩුය. එබැවින් බීජ වී වල පෙනුම ඉතා හොඳ තත්ත්වයේ තිබීම එහි ගුණාත්මය වැඩි කරයි.

**බිත්තර වී ගබඩා කිරීම**

ඉහත අන්දමට සකස් කරගත් බීජ විලඟ කන්නයට ගන්නාතෙක් ගබඩා කිරීම සඳහා තෙතමනය 13% කට අඩු ජල ප්‍රතිශතයක් දක්වා හොඳින් වේලා රශ්මිය හැරුණු පසු මළු වලට දමා හොඳින් වාතාශ්‍රය ලැබෙන පරිදි ගබඩා කර ගැනීම වඩාත් සුදුසුය. මෙහිදී එම මළු කෙලින්ම සිමෙන්ති හෝ මැටි පොළව මත නොගැටෙන සේ ලී රාමුවක් මත තැන්පත් කළයුතුය.

තෙත් කලාපයේදී මෙම වී බීජ වල ගබඩා වල ආර්ද්‍රතාවය වැඩි බැවින් කාලයත් සමග වී බීජ වල තෙතමන ප්‍රතිශතය වැඩි වී එය 15% - 16% දක්වා අගයකදී සමතුලිතතාවයකට පත්වේ. මෙවන් බීජ වල වී ප්‍රරෝහණය ක්‍රමානුකූලව හීන වී යන බැවින් එම වී කලක් තබාගත යුතු නම් නැවත අව්වේ දමා වියලා ගබඩා කිරීම වැදගත්ය.

ඔබේ කුඹුරේ වපසරියට අනුව බිත්තර වී ප්‍රමාණය තීරණය කළයුතු වේ. මේ සඳහා පහත වගුව ද උපයෝගී කරගත හැකිය.

**බිත්තර වී අවශ්‍යතාවය**

තමාගේ භූමියේ ප්‍රමාණය අනුව ඉහත බිත්තර වී ප්‍රමාණය සකසා ගැනීමට කුඹුරේ හොඳම ස්ථානයකින් කොටසක් වෙනම කපා පාගා ගැනීම වඩාත් ප්‍රායෝගික ක්‍රමයයි. අක්කරයක කුඹුරකට එලෙන බිත්තර වී ලබා ගැනීමට වර්ග මීටර් 100 ක වපසරියක් නඩත්තු කළ යුතුය.

ඉතාමත් උසස් තත්ත්වයේ වෙළඳ බිත්තර වී වල ප්‍රමිතීන් පහත සඳහන් පරිදි වියයුතු වේ.

| | |
|---|---|
| තෙතමනය | - 13 |
| පැලවීම (අවම) | - 85 |
| වී ඇට (අවම) | - 98 |
| වෙනත් අපද්‍රව්‍ය (උපරිම) | - 2 |
| ප්‍රභේදයට අමතරව ඇති වෙනත් ඇට (ග්‍රෑම් 500 කට උපරිම | - |
| වල් බීජ (ග්‍රෑම් 500 කට උපරිම) | - 10 |
| කෘමීන්/යාන්ත්‍රික හානි වූ ඇට (ග්‍රෑම් 500 කට උපරිම | - 200 |
| පෙනුම | - හොඳයි |
| සුවඳ | - හොඳයි |

මේ අනුව තමාගේ කුඹුරේ බිත්තර වී තමාම සකස් කර ගැනීම තුළින් දිනෙන් දින ඉහළ යන බිත්තර වී වලට පිළියමක් සේම වඩාත් ගුණාත්මක බිත්තර වී භාවිතයට ද ගොවි මහතාට අවස්ථාවක් සැලසේ.

| | කුඹුරේ වපසරිය | බීජ වල ස්වරූපය | | බිත්තර වී සෑදීම සඳහා නඩත්තු කළයුතු වපසරිය ($m^2$) දළ වශයෙන් |
|---|---|---|---|---|
| | | ලොකු ඇට | සිහින් ඇට | |
| i. | අක්කරයකට (වර්ග මීටර් 4000) | කි.ග්‍රෑ. 41 (බුසල් 2) | කි.ග්‍රෑ. 31 (බුසල් 1.5) | 100 |
| ii. | අක්කර 1/2 කට (වර්ග මීටර් 2000) | කි.ග්‍රෑ. 20.5 | කි.ග්‍රෑ. 15.5 | 50 |
| iii. | අක්කර 1/4 කට (වර්ග මීටර් 1000) | කි.ග්‍රෑ. 10.25 | කි.ග්‍රෑ. 7.75 | 25 |